# මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 (I)

මගේ අංකය : CPC/PSC/8/3/33-1
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක : 244, කටුගස්තොට පාර, මහනුවර.
2017 අප්‍රේල් මස 04 දින

මධ්‍යම පළාතේ
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභාලේකම්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ
සියළුම ආයතන ප්‍රධානින් වෙත.

## කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම
## සංවර්ධන නිලධාරි සේවය

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය මත මා විසින් 2016.10.14 දින නිකුත් කරන ලද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 විධිවිධාන පරිදි නියමිත සේවා ව්‍යවස්ථාව හෝ පරිපාටියේ සඳහන් විධිවිධානවලට අනුකූලව පැවැත්වීමට නියමිතව තිබූ කාර්යක්ෂමතා කඩඉම් විභාග අවස්ථා සංඛ්‍යාවට සමාන අනුගාමී විභාග සංඛ්‍යාවක් මගින් සම්පූර්ණ කළ හැකිය.

02. ඒ අනුව සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ට - 01 හි සඳහන් තනතුරු උපලේඛනයට අයත් තනතුරු දරන, රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා 1999 වර්ෂයේ සහ 2005 වර්ෂයේ බඳවාගත් නිලධරයන් සඳහා 2012.10.17 දින දක්වා පමණක් අනුමතව පැවති මධ්‍යම පළාත් ඒකාබද්ධ උපාධිධාරි කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාව හා අදාළ බඳවාගැනීමේ පරිපාටි අනුව 1 වැනි සහ 2 වැනි කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග වාර්ෂිකව පැවැත්විය යුතු බැවින් එම නිලධරයන්ට ස්වකීය පත්වීම් දිනයේ සිට පහත සඳහන් පරිදි සහන කාලයන් හිමි වේ.

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු කාලසීමාව | විභාග අවස්ථාව | 1999 වර්ෂයේ බඳවාගත් උපාධිධාරින් සඳහා සහනය ලබාදීමට අදාළ විභාගය පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1 වැනි කාර්යක්ෂමතා කඩඉම | වැටුප් පරිමාණයේ 4 වන වැටුප් පියවරට ළඟාවීමට පෙර සමත්විය යුතුය | පළමු | 2003.06.07 |
| | | දෙවන | 2005.03.20 |
| | | තෙවන | 2006.02.23 |
| 2 වැනි කාර්යක්ෂමතා කඩඉම | වැටුප් පරිමාණයේ 7 වන වැටුප් පියවරට ළඟාවීමට පෙර සමත්විය යුතුය | පළමු | 2006.09.02 |
| | | දෙවන | 2008.03.16 |
| | | තෙවන | 2008.12.21 |
| | | සතරවන | 2009.11.21 |
| | | පස්වන | 2010.03.06 |
| | | සයවන | 2010.11.13 |

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කළ යුතු කාලසීමාව | විභාග අවස්ථාව | 2005 වර්ෂයේ බඳවාගත් උපාධිධාරින් සඳහා සහනය ලබාදීමට අදාළ විභාගය පැවැත්වූ දිනය |
|---|---|---|---|
| 1 වැනි කාර්යක්ෂමතා කඩඉම | වැටුප් පරිමාණයේ 4 වන වැටුප් පියවරට ළඟාවීමට පෙර සමත්විය යුතුය | පළමු | 2007.07.07 |
| | | දෙවන | 2008.01.05 |
| | | තෙවන | 2009.06.06 |
| 2 වැනි කාර්යක්ෂමතා කඩඉම | වැටුප් පරිමාණයේ 7 වන වැටුප් පියවරට ළඟාවීමට පෙර සමත්විය යුතුය | පළමු | 2010.03.06 |
| | | දෙවන | 2010.11.13 |
| | | තෙවන | 2011.08.07 |
| | | සතරවන | 2012.09.30 |
| | | පස්වන | සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථා "සංශෝධන අංක 02" යටතේ II ශ්‍රේණියට උසස්වීම් ලද පසු සමත්විය හැකිය. |
| | | සයවන | |

35

03. මෙය අතීතයට ද බලපාන පරිදි සිදුකරනු ලබන සහන සැලසීමක් වන හෙයින් පහත සඳහන් කරුණු/ අතීතයේදී අභිමි වූ අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේදී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද ඒ පිළිබඳව කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

I. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ වෙනත් සේවාවන්ට පිවිසීමේ හෝ උසස්වීම් සඳහා වූ හෝ තරඟ විභාගයන්ට/ සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා කරන අභියාචනා.

II. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

III. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම් හඳුනා නොගෙන/ නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේදී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම් විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම් හෝ වරප්‍රසාදය ලබාගැනීමට ඉදිරිපත් කෙරෙන අභියාචනා.

04. ඒ අනුව ඉහත වගුවල දක්වා ඇති උක්ත සහන කාලය තුළ කාර්යක්ෂමතා කඩඉම් විභාග සමත්, සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථාවේ පරිශිෂ්ට - 01 හි සඳහන් තනතුරු උපලේඛනයට අයත් තනතුරු දරන, රජයේ ප්‍රමුඛතා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා 1999 වර්ෂයේ සහ 2005 වර්ෂයේ බඳවාගත් නිලධරයන් සඳහා ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 15:5:1 වගන්තිය පරිදි පරීක්ෂා කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

05. තවද ඉහත 04 වන ඡේදයේ සඳහන් නිලධරයන් හට අදාළ සහනයන් මෙම චක්‍රලේඛය මඟින් ලබාදී ඇති බැවින් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ - 02/2016 විධිවිධාන පරිදි නැවත ඉල්ලීම් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වමි.

මෙම කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

(මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කරන චක්‍රලේඛ, විභාග ප්‍රතිඵල සහ වෙනත් විශේෂ දැනුම්දීම් ඔබගේ පහසුව සඳහා අපගේ නිල වෙබ් අඩවිය වන ***www.psc.cp.gov.lk*** වෙතින් භාගත කරගත හැකිය.)